# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 41 දරන අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධි සංවර්ධන අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත

---

[**සහතිකය සටහන් කළේ 2006 නොවැම්බර් මස 06 වන දින**]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 නොවැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල :** රු. 4.25 යි. තැපැල් ගාස්තුව **:** රු. **5.00** යි.

## 2006 අංක 41 දරන අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධි සංවර්ධන අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2006 නොවැම්බර් මස 06 වන දින]

එල්.ඩී.—ඕ. 20/2004.

### අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධි සංවර්ධන අරමුදල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධි සංවර්ධන අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන අරමුදලක්, ඒ අරමුදලේ සාමාජිකයන් විසින් එකඟ වූ රීති අනුව, එකී අරමුදල හා සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා පිහිටුවා තිබූ බැවින් ද : පූර්විකාව.

එකී අරමුදල පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද එකී පරමාර්ථ සහ කරුණු එකී අරමුදල විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් ද, එකී අරමුදල සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලීමක් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2006 අංක 41 දරන අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධි සංවර්ධන අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසුව (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධි සංවර්ධන අරමුදලෙහි දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජය ශ්‍රී මහ බෝධි සංවර්ධන අරමුදල" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ අරමුදල විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය. අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධි රන්වැට අරමුදල සංස්ථාගත කිරීම.

**3**. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) පූජනීය ජය ශ්‍රී මහ බෝධිය වටා රන්වැටක් තැනවීම සහ අවශ්‍ය අවස්ථාවල දී එකී රන්වැටේ නඩත්තු කටයුතු සහ ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කරවීම ;

(ආ) ජය ශ්‍රී මහ බෝධිමළුව ඇතුලත සම්ප්‍රදායික, බෞද්ධාගමික හා සංස්කෘතික වතාවත් ඉටු කළ හැකි අන්දමින් එහි පරිසරය සකස් කිරීමට වග බලා ගැනීම සහ ඊට පහසුකම් සැළසීම ;

(ඇ) පූජනීය ජය ශ්‍රී මහ බෝධිමළුවෙන් පිටත භූමිභාගයේ බෞද්ධාගමික, පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වස්තූන් රැකෙන අන්දමින් පරිසරය සංරක්ෂණය කිරීම, භූමි නිර්මාණය කිරීම සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමතය හා අධීක්ෂණය යටතේ අනෙකුත් සංරක්ෂණ සහ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම ;

(ඈ) පූජනීය ජය ශ්‍රී මහ බෝධිමළුවට සම්බන්ධ ගොඩනැගිලි, ඉදිකිරීමේ යෝජනා ක්‍රමයක් සකස් කිරීම සහ අදාළ බලධරයන්ගේ උපදෙස් පරිදි නව පරිසරයක් සැළසුම් කිරීම ;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ අවබෝධ කරවීමෙහි ලා ප්‍රදර්ශණ, දේශණ, සම්මන්ත්‍රණ පැවැත්වීම, ප්‍රකාශන පළ කිරීම හා වෙනත් කටයුතු කිරීම ;

(ඊ) ජය ශ්‍රී මහ බෝධිය ප්‍රමුඛ අනුරාධපුර අටමස්ථානයේත්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ අටමස්ථානයට අනුබද්ධ වෙනත් සිද්ධස්ථානවලත් පැවැත්ම සඳහා කටයුතු කිරීම හා බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා කළ හැකි සෑම ක්‍රියා මාර්ගයක්ම අනුගමනය කිරීම ;

(උ) පූජනීය ජය ශ්‍රී මහ බෝධිය වටා ඉදි කෙරෙන රන්වැට ඉදිකිරීම හා සම්බන්ධ ඕනෑම කටයුත්තක් සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමතය හා අධීක්ෂණය යටතේ සහාය වීම ;

(ඌ) බුද්ධ ධර්මය සහ එහි දේශනා කර ඇති දැහැමි දිවි පෙවෙත ආරක්ෂා කිරීම හා ප්‍රචාරය කිරීම ;

(එ) ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි බෞද්ධ සංවිධාන සමග මිත්‍ර සම්බන්ධතා ඇති කර ගෙන, පවත්වා ගැනීම හා ඒ සඳහා ධෛර්ය ලබාදීම ;

සාමාජිකත්වය.

4. (1) සංස්ථාවේ ප්‍රධාන අනුශාසකවරයා වන, අටමස්ථානාධිපති ස්වාමීන්වහන්සේගේ උපදෙස් සහ නිර්දේශ මත, ගරු අග්‍රාමාත්‍යතුමා විසින් සංස්ථාවේ සාමාජිකයන් පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංඛ්‍යාව, පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන් ද ඇතුළත්ව, දස දෙනකුට නොඅඩු සහ විසි දෙනකුට නොවැඩි විය යුතු ය:—

(i) පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ii) මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(iii) බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් ජනරාල්වරයා;

(iv) අනුරාධපුර දිස්ත්‍රික් ලේකම්වරයා;

(v) ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(3) සංස්ථාවේ සෑම සාමාජිකයකු ම, ඔහු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා, කලින් ධුරය හිස් කළහොත් මිස ඔහු පත් කරනු ලැබූ දින සිට වසර පහක කාලයක් ධුරය දැරිය යුතු ය.

(4) සංස්ථාවේ සෑම සාමාජිකයකු ම තත් කාර්යය සඳහා අග්‍රාමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අග්‍රාමාත්‍යවරයා විසින් පිළිගනු ලැබූ විට බලාත්මක විය යුතු ය.

(5) අටමස්ථානාධිපති ස්වාමීන් වහන්සේ විමසා සංස්ථාවේ යම් සාමාජිකයකු සාමාජිකත්වයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(6) සංස්ථාවේ යම් සාමාජිකයකු මිය ගොස් ඇති, ධුරයෙන් ඉල්ලා අස් වී ඇති හෝ ඉවත් කරනු ලැබ ඇති අවස්ථාවක, එසේ මිය ගිය, ධුරයෙන් ඉල්ලා අස් වූ හෝ ඉවත් කරනු ලැබූ ඒ සාමාජිකයා වෙනුවට, අග්‍රාමාත්‍යවරයා විසින් ගරු අටමස්ථානාධිපති ස්වාමීන් වහන්සේගේ උපදෙස් හා නිර්දේශ මත වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලැබූ තැනැත්තා තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(7) කාලය ඉවත් වීමෙන් ධුරය හිස්කරන්නා වූ සංස්ථාවේ සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් විය යුතු ය.

සංස්ථාවේ රීති.

5. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සම්බන්ධයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකක ඡන්දයෙන්, සංස්ථාව විසින් කලින් කල සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. එවැනි රීතියක් සෑදීමෙන් පසු එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් එය වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

6. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පරිත්‍යාග, සම්මාදම් මුදල්, ගාස්තු හෝ පැවරුම් වශයෙන් ලැබෙන සියලු මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක, සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා යම් අගය ක්ෂයවීමේ අරමුදලක්, සංචිතයක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ සංස්ථාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) කවර හෝ ආකාරයකින් උද්ගත වූ, සංස්ථාවේ මුදල් හා දේපළ හුදෙක් ම එහි පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා අදාළ කර ගනු ලැබිය යුතු අතර, ඉන් කිසිම කොටසක්, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන්‍යාකාර ලාභයක් වශයෙන් සංස්ථාවේ සාමාජිකයන්ට කෙලින් ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම හෝ කරනු නොලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

7. (1) සංස්ථාවේ කටයුතු සභාපතිවරයා, උප සභාපතිවරයා, ලේකම්වරයා, භාණ්ඩාගාරික, උපලේකම්වරු සහ තවත් සාමාජිකයන් දෙදෙනකුගෙන් සමන්විත සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට

අනුව තෝරා පත් කර ගනු ලබන හයදෙනකුට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් යුක්ත කළමනාකරණ කමිටුවක් විසින් සංස්ථාවේ රීතිවලට අනුව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) අරමුදලේ ප්‍රථම කළමනාකරණ කමිටුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති අරමුදලේ කළමනාකරණ කමිටුව විය යුතු ය.

සාමාජික නාමලේඛනය.

8. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අරමුදලේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේ ම සහ ඉන්පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලබන සෑම තැනැත්තකුගේ ම නම ඇතුළත් කරගනු ලැබිය යුතු නාම ලේඛනයක් කළමනාකරණ කමිටුව විසින් පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය යුතු ය.

අරමුදල විසින් ගෙවිය යුතු සහ ඊට අයවිය යුතු ණය.

9. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති අරමුදලේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට අරමුදලට අයවිය යුතු සියලු ණය හා අරමුදල වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

10. යම් මිලයට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව වෙත සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාරගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය සහ හැකියාව ඇත්තේ ය. තව ද, එවැනි සියලු ම දේපළ මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවේ රීතිවලට යටත්ව ඒ දේපළ උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුතු ය.

දේපළ අත්කර ගැනීම, අරමුදල් ආයෝජනය කිරීම ආදිය සඳහා සංස්ථාවට ඇති සාමාන්‍ය බලතල.

11. මේ පනතේ සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට පහත සඳහන් බලතල තිබිය යුතු ය :—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදිකිරීමට හා අන්‍යාකාරයකින් ලබාගැනීමට සහ දැරීමට ;

(ආ) දායක මුදල්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ සියලු වර්ගවලට අයත් ත්‍යාග සහ අනුග්‍රහ ඉල්ලා සිටීම සහ භාර ගැනීමට ;

(ඇ) යම් තැනැත්තෙක්, යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට ;

(ඈ) යම් නීත්‍යානුකූල භාරයක් වශයෙන් දරනු ලබන හෝ ඊට අයත් නැතහොත් දරනු ලැබිය යුතු, යම් ස්ථාවර දේපළකට හෝ පෞද්ගලික දේපළකට බලපාන කොන්දේසි, සංස්ථාවක් හෝ වෙනත් යම් පුන්‍යාධාර සංගමයක්, මණ්ඩලයක් හෝ වෙනත් යම් භාරයක් සමග එක්ව භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීමට ;

(ඉ) සංස්ථාවේ නිලධරයන් සහ සේවා නියුක්තයන් පත්කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ අරමුදල විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට ;

(ඊ) අරමුදලේ ප්‍රතිලාභය සඳහා සේවා නියුක්තයන් පුහුණු කිරීමට.

විගණනය හා ගිණුම්.

**12.** (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය ;

(ආ) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය ;

(ඇ) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් —

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත්

යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

**13**. සංස්ථාවේ සාමාජිකයකු සහ ලේකම්වරයා හෝ කළමනාකරණ කමිටුව විසින් යථාපරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු හෝ ඉදිරිපිට දී හැර අරමුදලේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට සළකුණක් වශයෙන් ඔවුන් විසින් එම සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

**14**. සංස්ථාවේ කිසිම සාමාජිකයකු අරමුදලේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ඒ සාමාජිකයාගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය. සාමාජිකයන්ගේ වගකීම් සීමාකිරීම.

**15**. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලැබ ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම හෝ සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන නිශ්චය කරනු ලැබිය යුතු ය. විසුරුවා හැරීමේදී ඉතිරි වන දේපළ.

**16**. ජනරජයේ, යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ නොවිය යුතු ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**17**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.